Founded
1981

Incorporated
1989

# National Construction Association of Sri Lanka

"Idikireem Medura", No. 350 A, Pannipitiya Road, Pelawatta, Battaramulla, Sri Lanka
Tel: 114 422222 , 011 2784355
Web: www.ncasl.lk E-mail: info@ncasl.lk

2025.08.22

සියළුම සාමාජික මහත්ම, මහත්මීන් වෙත,

අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ මග පෙන්වීම අනුව ඉදිකිරීම් කර්මාන්තයේ දැනට පවතින ගැටළු පිළිබඳව ඉදිකිරීම් කරුවන්ගේ අදහස් හා යෝජනා පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අප සංගමයට 2025.07.30 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ආරාධනා කර තිබිණ.

එම සාකච්ඡාව ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් ජී. එම්. ආර්. ඩී. අපොන්සු මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, එහිදී එතුමා පහත සඳහන් කරුණු පිළිබඳව අප සංගමයේ අදහස් විමසීය.

a. ඉදිකිරීම් කර්මාන්තය ක්‍රියාශීලීව පවත්වාගෙන යාමෙන් ඉදිරියේදී ඇතිවන දැවැන්ත සංවර්ධනය හමුවේ (නව ව්‍යාපෘති ඇරඹීම හා අතරමග නවත්වන ලද ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කිරීම) ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය අවශ්‍ය පරිදි ඉදිකිරීම් කරුවන් යෙදවීමේ හැකියාව, සම්බන්ධීකරණය කිරීමේ හැකියාව හා පුහුණු කිරීමේ හැකියාව.
b. ව්‍යාපෘතිවල වියදම් පෙර ආණ්ඩු කාලවලදී මෙන්ම ඉතා ඉහල අගයක් පැවතීමට හේතු සහ එය අවම කිරීම.
c. ඉදිකිරීම් කර්මාන්තයේ පවතින ගැටළු පිළිබඳව.

අපගේ අදහස් ගරු ජනාධිපති තුමාට යොමු කර ඉදිකිරීම් කර්මාන්තයේ දැනට පවතින ගැටළු නිරාකරණය කිරීමට ක්‍රියා කරන බව ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් තුමා පැවසීය.

මෙහිදී අප ගරු සභාපති වන ඩැරින්ටන් පෝල් මහතා ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් තුමාගේ අවධානය යොමු කරමින් පහත සඳහන් පරිදි කරුණු දැක්විය.

1. ගිය රජයන් කාලවල දී දූෂණ වැඩියන්ම සිදුවූයේ අයාචිත යෝජනා (unsolicited proposals) හරහා ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වල බවත් සාමාන්‍ය පරිදි ලංසු කැඳවා ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වල දූෂණය අවම වූ බවද පැවසීය. තවද උග්‍ර ආර්ථිකය හමුවේ අමුද්‍රව්‍ය, මිනිස් ශ්‍රමය හා උපකරණ වල මිල ඉහල යාම නිසා, ව්‍යාපෘති වල පිරිවැය අධික වී ඇති බවය. නමුත් මිල විචලන සූත්‍රය හරහා ඩොලර් අගය අඩු වීමත් සමග ව්‍යාපෘති වල පිරිවැය අඩුවන බව ද පෙන්වා දුන්නේය.

2. අද පවතින අවාසනාවන්ත තත්වය නම් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩුවෙන් ලංසු ඉදිරිපත් කිරීම බව පෙන්වාදුන්නේය. ඒමගින් ඉදිකිරීම් කර්මාන්තය ද, ඉදිකිරීම් කරුවා ද, තවත් අගාධයට යන ආකාරය පැහැදිලි කෙරිණ. ඉංජිනේරු ඇස්තමේන්තු පිළියළ කරනු ලබන්නේ සම්මතයන් (norms) අනුවය. එයට අදාල මිල ගණන් ලබා දීමත් පිරිවැය සංස්කරණ අතර පොදු කාර්ය (overheads) සහ ලාභාංශය (Profit) එයට එකතු කරනු ලැබේ. එමනිසා ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව සකස්කරන්නේ නම් අඩු මුදලට ලංසු ඉදිරිපත් කරන ලංසු කරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කල හැක. තවද

නිවැරදි වූ පිරිවිතර අනුව නිවැරදි ප්‍රමාණ බිල්පත් (BOQ) සකසන්නේ නම්, අමතර හිමිකම් (Claims) කොන්ත්‍රාත් කරුවනට ගෙවීම අවම කර ගත හැකි බවද පෙන්වා දුන්නේය.

මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගියහොත් ඉදිරි මාස 7-8 තුල මෙම කර්මාන්තයේ බිඳ වැටෙනු ඇත. තවද ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදි නොවන්නේ නම් එය තුන්වන පාර්ශවයක් යොදා නැවත සමලොල්චනය (Review) කල යුතුය.

තවද රජයේ ආයතන වලින් අසාර්ථක වූ ව්‍යාපෘති වල ලයිස්තුවක් ලබාගත හොත් ඒවා අඩු ලංසු ඉදිරිපත් කිරීමෙන් ලබා ගත් ඒවා බව සනාථ වන බවද සභාපති වරයා දැන්විය. එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තුවලට වඩා 10% කට වැඩි ලංසු ද, 15% කට අඩු ලංසු ද, ප්‍රතික්ෂේප කිරීමට යෝජනා කෙරිණි.

3. 04/2016 (i, ii, iii, iv) මුදල් චක්‍රලේඛන අහෝසි වීම තුලින් සුළු පරිමාණ කොන්ත්‍රාත් කරුවන්ට සිදුවන අසාධාරණය පෙන්වා දුන් අතර මහා පරිමාණ කොන්ත්‍රාත් කරුවන් සුළු පරිමාණ ව්‍යාපෘති සඳහා ලංසු ඉදිරිපත් කිරීමට එය රුකුලක් වූ බවද පැවසීය. එයට තවත් හේතුවක් ලෙස ප්‍රමාණවත් ව්‍යාපෘති නොමැති වීම බවද පෙන්වා දුන් අතර අඩු ලංසු ඉදිරිපත් කිරීම හේතුවෙන් එම ව්‍යාපෘති වල තත්වය අවම වන බවත් නිසි කලට ව්‍යාපෘති නිමා නොවන බවද පෙන්වා දුන්නේය.

4. තවද අය-වැය මගින් රුපියල් බිලියන 4.5ක් ඉදිකිරීම් කර්මාන්තය සඳහා වෙන් කලද, ලංසු ලේඛන පිළියෙළ කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එම මුදල ඉදිකිරීම් කර්මාන්තයට ගලා ඒම ප්‍රමාද වන බව පෙන්වා දුන්නේය. එයට හේතු වශයෙන් රාජ්‍ය ආයතන වල පවතින ඉංජිනේරු වරුන්ගේ හිඟය හා සිටින ඉංජිනේරු වරුන්ගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව අවබෝධය අඩු වීමත් බව ප්‍රකාශ කළේය. එහි දී ජ්‍යේෂ්ඨ අතිරේක ලේකම් වරයා පෙන්වා දුන්නේ ඉංජිනේරු වරුන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා දැනටමත් රජය පියවර ගෙන ඇති බවය. අයවැයෙන් වෙන්කෙරුන ප්‍රතිපාදන ඉදිකිරීම් කර්මාන්තයට ගලා නොඒම තුලින් සිදුවන අයහපත සභාපති වරයා පෙන්වා දුන් අතර, ඊට විසඳුමක් වශයෙන් පුද්ගලික උපදේශන ආයතන යොදා ගත හැකි බවත් "Design & Build" ක්‍රමය හරහා වැයවන කාලය විශාල වශයෙන් අවම කර ගත හැකි බවද පෙන්වා දුන්නේය. තවද අවුරුදු පහක පමනවත් නඩත්තු කාලයක් එකී කොන්ත්‍රාත් වලට ඇතුලත් කිරීමෙන් නිමවන වැඩ ඉතා උසස් තත්වයෙන් පවත්වා ගෙන යා හැකි බව ද පෙන්වා දුන්නේය.

5. තවද දැනට කෙරීගෙන යන කුඩා පරිමාණයේ ව්‍යාපෘති වලින් පමණක් ඉදිකිරීම් කර්මාන්තය හෝ ඉදිකිරීම් කරුවන් වැඩි දියුණු නොවන බවද පෙන්වා දුන්නේය. මහා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කිරීමත් නවතා ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමෙනුත් ඉදිකිරීම් කරුවන් දැනටමත් යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් කර ඇති ආයෝජනය සඵලදායි කර ගත හැකිබවද පෙන්වා දුන්නේය.

6. මිල විචලන සූත්‍රය භාවිතා කිරීමේදී එහි නිර්වද්‍යතාවය අප සංගමය මැදිහත් වීමෙන් 75% ක පමණ නිවැරදි ප්‍රමාණයකට ගෙන ඒමට හැකි වූ අතර, MEP අයිතමයන් වල මිල විචලනය පිළිබඳව විධිමත් ක්‍රමයක් CIDA ආයතනය හඳුන්වා දිය යුතු බවද සභාපති තුමා පෙන්වා දුන්නේය.

7. CGF ඇපකර රාජ්‍ය ආයතන පිළිනොගනීමෙන් එම ආයතනය පිහිටවීමේ අභිමතාර්ථ ඉටු නොවන බවත් සුළු පරිමාණ ඉදිකිරීම් කරුවන්ට CGF ඇපකර පහසුවෙන් ලබාගත හැකි ක්‍රමවේදයක් සැකසිය යුතු බවද සභාපතිවරයා අනාවරණය කළේය. තවද ඉංජිනේරු ඇස්තමේන්තු වලට වඩා ඉතා අඩුවෙන් ලංසු ඉදිරිපත් කරන ඉදිකිරීම් කරුවන්ට එම ඇපකර ලබාදීම සුදුසු නොවන බවද ප්‍රකාශ කළේය.

8. SSCL බද්ධ 2020.10.01 දිනට පෙර පිරිනමන ලද කොන්ත්‍රාත් සඳහා ද බල පවත්වීම අසාධාරණ බව පෙන්වා දුන් අතර, දැනට පවතින ලංසු ලේඛන අනුව එය ප්‍රතිපූර්ණය කල හැකි බව පෙන්වා දුන්නේය.

එසේ නොහැකි නම් ඒ සඳහා ද චක්‍රලේඛනයන් නිකුත් කල යුතු බවද පැවසීය. ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් තුමා පොරොන්දු විය.

9. රජයේ ඉදිකිරීම් මෙන්ම පෞද්ගලික අංශයේ ඉදිකිරීම් ද ධෛර්යමත් කල යුතු බව පෙන්වා දුන් අපගේ සභාපති තුමා ගොඩනැගිලි සැලසුම් අනුමත කරගැනීමේදී වන ප්‍රමාදයන් වලක්වා ගත යුතු බව ද කියා සිටියේය. මෙහිදී සමහර විදේශ ආයෝජකයින් මෙම කරුණ නිසාම තම ආයෝජන නැවත රැගෙන ගොස් ඇති බවට වාර්තා වී ඇත. එම නිසා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම මාසයක් පමණ වන කාලයකින් සිදු කිරීමට පියවර ගත යුතු බවද අවධාරණය කළේය.

10. ජාතික ප්‍රසම්පාදන කොමිසම විසින් පළ කරන ලද ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ තිබෙන අඩුපාඩු ඉදිකිරීම් කර්මාන්තයේ නියැලෙන සියළු දෙනා එකතුව සාකච්ඡා කර නිවැරදි කල යුතු බවද සභාපති තුමා පෙන්වා දුන් අතර, ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් තුමා ඒ පිළිබඳව පියවර ගන්නා බවද දැන්වීය. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ CIDA ආයතනයේ සම්මත ලංසු ලේඛන (SBDs) අතර පවතින විෂමතා සභාපති වරයා පහදා දුන්නේය. ඒ කෙසේ වෙතත් දැනට පවතින ප්‍රසම්පාදන මාර්ගෝපදේශය හා සම්මත ලංසු ලේඛන අනුගමනය නොකරමින් රාජ්‍ය ආයතන ලංසු කැඳවීමේ දී විශාල වංචා සිදුවිය හැකි බවද පෙන්වා දුන්නේය.

11. ප්‍රසම්පාදන මාර්ගෝපදේශය මගින් කොන්ත්‍රාත්කරුවන්ගේ ශ්‍රේණි සීමාවන් ඉහල දමා ඇත. නමුත් එහි දී මෑත කාලීන ආර්ථික අර්බුදවල බලපෑම නොසලකා ඇත. එබැවින්, කුඩා පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන් සුදුසුකම් ලබන ව්‍යාපෘති සඳහා ලංසු තැබීමට අවස්ථාවක් නොමැත. එමනිසා ලංසු ඇගයීමේදී නිම කරන ලද සමාන ව්‍යාපෘති සලකා බැලීමේදී නිම කරන ලද ව්‍යාපෘතියේ කාලීන වටිනාකම නොසැලකීමෙන් එම ලංසු ප්‍රතික්ෂේප වන බව පෙන්වා දුන්නේය. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දැනට ක්‍රියාත්මක කරන පරිදි, යෝජිත ව්‍යාපෘතියේ වටිනාකමෙන් 70% ක නිම කරන ලද ව්‍යාපෘති, සමාන ව්‍යාපෘති සඳහා සලකා බලන ලෙස අපගේ සභාපතිවරයා ඉල්ලා සිටියේය.

12. වැලි, කළුගල් හා පස් සඳහා දැනට බලපත්‍ර නිකුත් කරන ක්‍රමවේදයේ අඩු පාඩු පවතින බව පෙන්වා දුන් සභාපති වරයා ප්‍රමාණ සුත්‍රයේ (BOQ) හි සඳහන් ප්‍රමාණ කරදරයකින් තොරව ඉදිකිරීම් කරුවන්ට ලබා ගැනීමට ක්‍රම වේදයක් අවශ්‍ය බවද දැන්වීය. ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් තුමා පෙන්වා දුන්නේ වැලි වලට විසඳුමක් ලෙස මුහුදු වැලි ලබාගැනීම. මේ සඳහා දැනටමත් පියවර ගෙන ඇති බවය.

13. නිම කරන ලද ව්‍යාපෘති වල බිල්පත් ප්‍රමාද වී ඇති බවත්, ඒවා හැකි ඉක්මනින් පියවන ලෙසටත්, ඉදිරියේදී සම්මත ලංසු ලේඛන වල සඳහන් පරිදි බිල්පත් භාරදී දින 35කින් එම බිල්පත් පියවීම සඳහා චක්‍රලේඛනයක් රජයේ නිලධාරීන්ට නිකුත් කරන බවද ඉල්ලා සිටියේය. මෙමගින් රජයට ප්‍රමාද ගාස්තු ගෙවීමෙන් වන පාඩුව අවම කර ගත හැකි බවද ඉදිකිරීම් කරුවන්ගේ මූල්‍ය ශක්තිය ඉහල යාමෙන් ව්‍යාපෘති නිසි කලට උසස් තත්වයෙන් නිම කල හැකි බවද පෙන්වා දුන්නේය

14. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි හල් (Hardware Stores) සහ ඉන්ධන පිරවුම් හල් වලින් VAT බිල්පත් නිකුත් නොකිරීම නිසා ඉදිකිරීම් කරුවනට සිදුවන අපහසුතාවය හා රජයට විශාල ආදායම අහිමි වීම සම්බන්ධයෙන්ද සභාපති තුමා කරුණු ඉදිරිපත් කළේය. ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් තුමා එකඟ විය.

15. තවද VAT බදු, ආදායම් බදු හා අනෙකුත් බදු අයකර ගැනීමේ ක්‍රමවේදය යාවත්කාලීන කලයුතු බව පෙන්වා දුන් සභාපතිවරයා සියළු කොන්ත්‍රාත් පිරිනමන ලිපි වල පිටපතක් දේශීය ආදායම්

දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කිරීමට සියළු රාජ්‍ය ආයතන වලට චක්‍ර ලේඛනයක් නිකුත් කරන ලෙසට ද ඉල්ලා සිටියේය.

16. රාජ්‍ය ආයතන ප්‍රමාණ පත්‍ර සැකසීමේ දී CIDA ආයතනය මගින් පලකරන ලද "Preliminary Bill" වල සමහර අයිතම ඉවත් කරන අතර සමහර අයිතම සඳහා යොදන ඇස්තමේන්තු මුදල් කිසි සේත් ප්‍රමාණවත් නොවේ. විශේෂයෙන්ම වැඩබිම සේවකයින්ගේ ආරක්ෂාව සඳහා ඇස්තමේන්තු කරන මුදල් ප්‍රමාණවත් නොවීමෙන් ඔවුනට ලබාදෙන ආරක්ෂණ උපකරණ ආදිය ලබා නොදීම තුලින් ඉදිකිරීම් කර්මාන්තයට නවකයින් බඳවා ගැනීම අසීරු වී ඇත. තවද ග්‍රාමීය මට්ටමින් සිටින පෙදරේරු කාර්මිකයින්, වඩු කාර්මිකයින් සඳහා නවීන තාක්ෂනය පිළිබඳව දැනුවත් කල යුතු අතර, ඔවුන්ගේ හැකියාවන් ඔප මට්ටම් කිරීමද ව්‍යාපෘති වලින් කල හැකි බවද පෙන්වා දුන්නේය.

17. තවද ඉදිකිරීම් කරුවන් ඔවුන්ගේ වරදින් ව්‍යාපෘති ප්‍රමාද කරන්නේ නම් හෝ අදාල ප්‍රමිතීන්ට අනුගත නොවන්නේ නම් ඔවුන් අසාදු ලේඛන (blacklists) ගත කල යුතු අතර CIDA ආයතනය මගින් ඒවා අධීක්ෂනය කල යුතුය. එසේ නොවන ඉදිකිරීම් කරුවන්ගේ ලියාපදිංචිය අහෝසි කල යුතු අතර එසේ නොකිරීමෙන් එම වරදම නැවත නැවතත් සිදු වන බව පෙන්වා දුන්නේය.

18. තවද වරාය නගරයේ (Port City) ව්‍යාපෘති ආරම්භ කිරීත් සමග ඉදිරියේදී අපගේ කොන්ත්‍රාත් කරුවන්ගේ හිඟයක් ඇති වේද යන්න ජනාධිපති ජ්‍යේෂ්ඨ අතිරේක ලේකම් තුමා විමසීය. එයට පිළිතුරු වශයෙන් ඕනෑම ඉදිකිරීමක් සඳහා දේශීය ඉදිකිරීම් කරුවන්ට හැකියාව ඇති බවත් දැනටමත් අධිවේගී මාර්ග හා උස් ගොඩනැගිලි ඉදිකිරීමෙන් ඒ බව සනාථ කල ඇති බව ද සභාපති වරයා දන්වා සිටියේය. විදේශීය කොන්ත්‍රාත් කරුවන් පැමිණියද ඒවායේ උප කොන්ත්‍රාත් දේශීය කොන්ත්‍රාත් කරුවන්ට ලබා ගත හැකි බවද තවද විදේශ කොන්ත්‍රාත් කරුවන් සමග හවුල් ව්‍යාපාරයක් (JV) ආරම්භ කල හැකි බව දැන්වීය.

ස්තුතියි.
මීට විශ්වාසී,
**ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය**

ඉංජි. ආර්. බී. එම්. ගුණවර්ධන
ප්‍රධාන විධායක නිලධාරී